# ථේරවාද විනය සහ නූතන නෛතික මූලධර්ම

සී. ආනන්ද ශ්‍රේරු

විනය පිටකයෙහි සඳහන් ශික්ෂාපද පැනවීම කුමක් සඳහා ද යන්න විනය පිටකයේ ම මැනවින් සඳහන් කර තිබේ. එය ශික්ෂාපද පිළිබඳ මනා අවබෝධයක් ඇති කරගැනීමට හේතු වන්නේය. භික්ෂූන් ඇමතූ බුදුන්වහන්සේ මෙසේ පළ කළ හ.

"මහණෙනි, එසේ නම් භික්ෂූන්ට ප්‍රයෝජන දහයක් නිසා ශික්ෂාපද පනවන්නෙමි. සංඝයා ගේ යහපත් භාවය පිණිස, සංඝයා ගේ පහසුව පිණිස, හික්මවීමට අපහසු පුද්ගලයන්ට දඬුවම් පිණිස, ශීලාචාර භික්ෂූන් ගේ පහසුව පිණිස, මෙලොව කෙලෙස් සංවරය පිණිස පරලොව විපාක දෙන කෙලෙස් නැසීම පිණිස, පැහැදුනවුන් ගේ වැඩි පැහැදීම පිණිස, සද්ධර්මයා ගේ පැවැත්ම පිණිස, විනයට උපකාර පිණිස ශික්ෂාපද මෙසේ පනවමි."[1]

මෙසේ පනවන ලද ශික්ෂාපද ගැන විමසා බලන කල ඒවා සංඝයා ගේ හිතසුව පිණිස පමණක් නොව, ගිහියන් ගේ යහපතට මෙන් ම දහමේ පැවැත්මට ද, උපකාර වන බව මොනවට පැහැදිලි වේ. එසේ ම භික්ෂූන් ගේ විනය (discipline) රැකීමට මේවා හේතු වන බව ද මනා ලෙස පෙනී යයි. භික්ෂුවක ගේ පරමාර්ථය, අරමුණ කුමක් විය යුතුද? එය මැනැවින් දක්වා තිබේ. කෙලෙස් සංවරය, කෙලෙස් නැසීම, එම පරමාර්ථය විය යුතුය. එසේ කෙලෙස් නැසූ කල නිවන් අවබෝධ කර ගත හැකිය. ශික්ෂාපද පැනවීමේ දී බුදුහු ගිහියන් ගැන ද සැලකිලිමත් වූහ. ඒ නිසා ම නොපැහැදී ඇති ගිහියන් ගේ පැහැදීම ඇති කරලීම පිණිස සහ පැහැදී ඇති ගිහියන් ගේ පැහැදීම වැඩි දියුණු කිරීම පිණිස ශික්ෂාපද හේතු විය හැකි බව උන්වහන්සේ දැන ඒ අනුව කටයුතු කළ සේක. ගිහි - පැවිදි සම්බන්ධතාවය දෙපක්ෂයේ ම උන්නතියට, යහපතට හේතු වන බව අමුතුවෙන් කිව යුතු නැත.